යොවුන් සිනමාවේදී

# විමුක්ති ජයසුන්දර

## යලිත් වරක් අන්තර්ජාතික සිනමා සම්මානයකින් පිදුම් ලද වගයි. . . .



ජපානයේ ටෝකියෝහිදී නිමාව දුටු '16 වෙනි ටෝකියෝ ෆිල්මෙක්ස් අන්තර්ජාතික සිනමා උළෙලේ ' (16th Tokyo Filmex International Film Festival) තරගකාරී අවසන් වටය නියෝජනය කල විමුක්ති ජයසුන්දරගේ ' සුළඟ ගිනි අරන් (Dark in the White Light) නම් වෘත්තාන්ත සිනමාපටය, ජූරියේ විශේෂ සදහනකින් (Jury Special Mention) පිදුම් ලැබීමට සමත්විය.

16 වෙනි අදියරේ 'ටෝකියෝ ෆිල්මෙක්ස් අන්තර්ජාතික සිනමා උළෙල' නියෝජනය කිරීම උදෙසා ආසියානු කලාපීය සිනමා සිත්තම් 35ක් සුදුසුකම් ලැබ තිබූ අතර, ඒ අතරින් චීනය, ජපානය, දකුණු කොරියාව, පිලිපීනය, තායිලන්තය, තායිවානය, කසකස්ථානය, නේපාලය සහ ශ්‍රී ල'කාව යනාදී රටවල් 09ක් නියෝජනය කල සිනමාපට 10ක් උළෙලේ තරගකාරී අංශය යටතේ තරග වැදීමට සුදුසුකම් ලැබීය.

2000 වර්ෂයේදී සමාරම්භය සනිටුහන් කල ටෝකියෝ ෆිල්මෙක්ස් අන්තර්ජාතික සිනමා උළෙලේදී, මීට පෙරාතුරුව 2009 වර්ෂයේදී විමුක්ති ජයසුන්දරගේ 'අහසින් වැටෙයි' (Between Two Worlds) සිනමාපටයත්, 2011 වර්ෂයේදී සංජීව පුෂ්පකුමාරගේ 'ඉගිල්ලෙන මාළුවෝ' (Flying Fish) සිනමාපටයත්, උළෙලේ තරගකාරී අංශය නියෝජනය කිරීමට වරම් හිමිව තිබුනි. එනමුදු ෆිල්මෙක්ස් සිනමා උළෙලේදී ශ්‍රී ලංකාව සම්මානයකට පාත්‍ර වූ ප්‍රථම අවස්ථාව ලෙසට මෙය වාර්තා පොත් අතරට එක්වේ.

ටෝකියෝ ෆිල්මෙක්ස් අන්තර්ජාතික සිනමා උළෙලේදී 'සුළඟ ගිනි අරන්' ලද ජයග්‍රහණයත් සමග, සිය සිනමාපට උදෙසා විමුක්ති ජයසුන්දර ලද සමස්ථ අන්තර්ජාතික තරගකාරී සිනමා සම්මාන සංඛ්‍යාව 11ක් බවට පත්විය. මෙකී සම්මාන සංඛ්‍යාව, 68 වසරක ශ්‍රී ලාංකේය සිනමා ඉතිහාසයේ ශ්‍රී ලාංකේය අධ්‍යක්ෂකවරයෙකු ලද සිව් වන වැඩිම අන්තර්ජාතික තරගකාරී සිනමා සම්මාන සංඛ්‍යාව ලෙසින් සටහන්වන අතර, එහි පළමු, දෙවන හා තෙවන ස්ථානය පිළිවෙලින් සෝමරත්න දිසානායකයන්ට හා ප්‍රසන්න විතානගේට සහ අශෝක හඳගමයන් හට හිමි වේ.

2005 වර්ෂයේදී සුළඟ එනු පිණිස (The orsaken Land) සිනමාපටය තුළින් ශ්‍රී ලාංකේය සිනමාවට අවතීර්ණ වූ විමුක්ති ජයසුන්දර මේ වන විට සිය සියළුම සිනමා නිර්මාණ උදෙසා (සුළඟ එනු පිණිස, අහසින් වැටෙයි, චත්‍රක්, සුළඟ ගිනි අරන්) අන්තර්ජාතික සිනමා සම්මානයෙන් පිදුම් ලැබීමට සමත්ව තිබීම කැපී පෙනේ.

2015 වසරේ අගෝස්තු මස ස්විට්සර්ලන් යේදී නිමාව දුටු, ලොව 'ඒ ශ්‍රේණියේ ලෝකර්නෝ සිනමා උළෙලේ 'ප්‍රධානතම තරගකාරී අංශය' හරහා අන්තර්ජාතික සිනමා උළෙල සහභාගිත්වයේ ආරම්භය සනිටුහන් කල 'සුළඟ ගිනි අරන්' මේ වන විට නියෝජනය කළ සමස්ථ අන්තර්ජාතික උළෙල සංඛ්‍යාව 07කි. මෙහිදී Locarno FF- ස්විට්සර්ලන්තය, Tokyo FILMeX - ජපානය, Vladivostok IFF - රුසියාව, Festival des 3 Continents - ප්‍රංශ " Asia Pacific Screen Awards – ඕස්ට්‍රේලියාව යන සිනමා උළෙල වල ප්‍රධානතම තරගකාරී අංශය නියෝජනය කල 'සුළඟ ගිනි අරන්' සිනමාපටය මීට අමතරව Busan IFF – දකුණු කොරියාව හා Singapore IFF - සිංගප්පූරුව සිනමා උළෙලවල තිරගත කරලීම උදෙසාද සුදුසුකම් ලැබීය.







මහේන්ද්‍ර පෙරේරා, ස්ටීව් ද සිල්වා, බන්දුල විතානගේ, රොෂාන් රවීන්ද්‍ර, රුවීන් ද සිල්වා, කෞෂල්‍යා ප්‍රනාන්දු, සුරංගා රණවක, සුලෝචනා වීරසිංහ හා තිලක්ෂිනි රත්නායකගේ රංගන දායකත්වයෙන් හැඩ වෙන 'සුළඟ ගිනි අරන්' සිනමාපටයේ කැමරාකරණය චන්න දේශප්‍රිය හා ධනුෂ්ක ගුනතිලක සුසංයෝගයකිනි. මීට අමතරව සමන් ඇල්විටිගලගේ සංස්කරණ දායකත්වයද, ලක්ෂ්මන් ජෝසප් ද සේරම්ගේ සංගීත නිර්මාණ දායකත්වයද, ලාල් හරේන්ද්‍රනාත්ගේ කලා අධ්‍යක්ෂණ දායකත්වයද, දිනිදු ජාගොඩගේ පසු නිශ්පාදන අධීක්ෂණ දායකත්වයද මේ සඳහා හිමිව ඇත.

උදිත ලක්මාල් කහදවආරච්චි

EVENT

# පිං වඩන පුණ්‍යභූමි වන්දනා

## මුහුරත් උළෙල.....







